අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ
චක්‍රලේඛ අංක 1993/24

මගේ අංකය: කෘෂි /110
**කෘෂිකර්ම ශාඛාව,**
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
'ඉසුරුපාය'
බත්තරමුල්ල.

1993 නොවැම්බර් මස 18 දින.

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාශ භාර නි. අ. අ. වරුන් හා
විදුහල්පතිවරුන් වෙත.

## 1994 වසර පාසල් කෘෂිකර්ම අධ්‍යාපන වැඩපිළිවෙල

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 1992/16 හා අංක 1993/13 චක්‍රලේඛවලට අමතරව 1994 වසරේ දී පාසල්වල ක්‍රියාත්මක කළ යුතු කෘෂිකර්ම හා පරිසර අධ්‍යාපන වැඩ පිළිවෙල පහත සඳහන් පරිදි ඉදිරිපත් කරමි. එක් එක් ප්‍රදේශවල දේශගුණික තත්ත්වයන් හා අවශ්‍යතාවයන් අනුව බෝග වර්ග, වගා කාල හා කරග සංවිධාන එකවාගු වෙනස් කළ හැකිය.

02. සෑම පාසල් වත්තක්ම සෝදාපාළුවෙන් ආරක්ෂා වන පරිදි භූමි අලංකරණ හා පරිහරණ වැඩසටහනක් මනාව සැලසුම් කර ඒ අනුව වගා කළ යුතුය. මෙයට කෘෂිකර්ම ගුරුවරුන් හා කෘෂිකර්මය හදාරණ සිසුන් පමණක් නොව පාසලේ සිටින සියලුම ගුරුවරුන් හා සිසුන් සහභාගි විය යුතුය. මේ සඳහා අවශ්‍ය පරිදි සතියකට කාලච්ඡේද 2 ක් වෙන් කළ හැකිය. පාසල් කෘෂිකර්ම කටයුතු ඉහත 1993/13 චක්‍රලේඛ අනුව පිහිටුවන ලද පාසල් තරුණ ගොවි සමාජ මගින් ද, කළ හැකිය. ප්‍රායෝගික කටයුතු සඳහා පාසල් සිසුන්ගේ උනන්දුව වැඩි කිරීම පිණිස කෘෂිකර්මය, ගෙවතු වගා ආදී විෂයයන් වෙනුවෙන් පාසලේ පවත්වන විභාග සඳහා ප්‍රායෝගික අංශයට ලකුණු 50% ක් දීම නිර්දේශ කළ හැකිය.

03. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත නව බෝග ප්‍රභේද පාසල් වත්තේ බෝකර ප්‍රජාව ව්‍යාප්ත කිරීමේ වැඩ සටහන් ද ආරම්භ කළ හැකිය. මේ අනුව දැනටමත් පාසල් කෘෂි සම්පත් මධ්‍යස්ථාන මගින් අලුත් බතල වර්ග ප්‍රජාවට බෙදා දී ඇත. පාසල් වත්තේ සාමාන්‍ය බෝග වගා කිරීමට අමතර ව සම්පත තිබෙන පාසල්වල විශේෂ ව්‍යාපෘති ආරම්භ කළ හැකිය. දැනටමත් බොහෝ පාසල්වල කාබනික පොහොර නිෂ්පාදනය, බිම්මල් වගාව, අල බෝග නිෂ්පාදනය, බඳුන් පැල හා තවාන් පැල නිෂ්පාදනය, මී මැසි පාලනය, එළවළු වගාව, මල් වගාව, විසිතුරු ශාක නිෂ්පාදනය ආදී ව්‍යාපෘති ආරම්භ කර ඇත. තව ද බස්නාහිර පළාතේ පාසල්වල මිරිස් වගා කිරීමේ ව්‍යාපෘතියක් ද දකුණු පළාතේ පාසල්වල අපනයන බෝග නිෂ්පාදන ව්‍යාපෘතියක් ද මධ්‍යම පළාතේ හතු වගා කිරීමේ ව්‍යාපෘතියක් ද ඌව පළාතේ දුව පැල නිෂ්පාදන ව්‍යාපෘතියක් ද ආරම්භ කර ඇත.

04. පාසල් වතු වගා කිරීමේ දී හැකිතාක් දුරට කොම්පෝස්ට් පෝර, ගොම්පළ පෝර, අමුකොළ පෝර, ආදී කාබනික පෝර යොදා ගත යුතු අතර අහිතකර කෘෂි රසායනික ද්‍රව්‍ය යෙදීම අවම කළ යුතුය. මෙම ක්‍රමය ප්‍රජාවට ව්‍යාප්ත කිරීම පිළිබඳ ව පාසල ආදර්ශවත් විය යුතුය.

05. කෘෂිකර්ම අධ්‍යාපන දින දර්ශනය

5.1 ජනවාරි 03 සිට 07 දක්වා
පළමු වාරය පාසල් වතු වගාව හා කොම්පෝස්ට් පෝර නිෂ්පාදනය ආරම්භ කිරීම.

5.2 1994 ජනවාරි 15 සමස්ත ලංකා කෘෂි-රචනා තරගය 1993 රචනා යැවිය යුතු අවසාන දිනය.

5.3 අප්‍රේල් 26 සිට 30 දක්වා
දෙවන වාරයේ පාසැල් වතු වගා ආරම්භ කිරීම.

5.4 මැයි 11
යල් කන්නය සඳහා පාසල් වතු හා ගෙවතු තරඟ පැවැත්වීම.

5.5 ජූනි 05 ලෝක පරිසර දිනය
පරිසරය හා සංවර්ධනය් සම්බන්ධයෙන් විවිධ පරිසර තේමා යටතේ වැඩසටහන් සංවිධානය හා පාසල් භූමි අලංකරණ කටයුතු සංවිධානය.

5.6 ජූනි 23 සිට 29
ගම්උදාවට අදාළ කෘෂිකාර්මික වැඩ සටහන් ඉදිරිපත් කිරීම.

5.7 සැප්තැම්බර් 01 සිට 07
මහ කන්නය සඳහා පාසල් වතු වගා ආරම්භ කිරීම.

5.8 සැප්තැම්බර් 25
සමස්ත ලංකා පාසල් වතු හා ගෙවතු තරග ආරම්භ කිරීම.

5.9 සැප්තැම්බර් 17 ජාතික රුක් රෝපණ දිනය.
සැප්තැම්බර් මාසය ජාතික රුක් රෝපණ මාසය.

5.10 ඔක්තෝබර් 20 ජාතික ගොවි දිනය.
ඔක්තෝබර් 13 සිට 20 දක්වා ගොවි සතිය
පාසල් කෘෂිකර්ම කටයුතු- තරුණ ගොවි සමාජ උත්සව හා කෘෂිකර්ම තරග ත්‍යාග ප්‍රදාන.

5.11 කෘෂිකර්ම හා පාරිසරික කථික තරග, රචනා තරග, පෝස්ටර් චිත්‍ර තරග පැවැත්වීම (අනුග්‍රහකයින්ගෙන් ලත් දින වකවානු අනුව)

06. ඉහත සඳහන් වැඩපිළිවෙල සර්ථක කර ගැනීම සඳහා කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය විසින් විවිධ ආකාරයේ උපකාර කරනු ලැබේ. තව ද, මෙම වැඩපිළිවෙල සාර්ථක කර ගැනීම සඳහා පාසල් සංවර්ධන මණ්ඩලවල සහාය මුළුමනින්ම ලබාගත යුතුය. කෘෂිකර්මයට සම්බන්ධ නිලධාරීන්, ගුරුවරුන් පමණක් නොව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, විදුහල්පතිවරුන් හා ගුරු භවතුන් ආදී අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියලු ම දෙනා කෘෂිකර්මය කෙරෙහි උනන්දු විය යුතුය.

07. මෙම වැඩසටහන පළිබඳව ප්‍රගති වාර්තා ශ්‍රී. ඇම්. අභයවර්ධන, අධ්‍යාපන අධ්‍යක්ෂ (කෘෂි) වෙත ඉහත ලිපිනයට එවන්නේ නම් මැනවි.

08. ඉහත වැඩ පිළිවෙල සාර්ථක කර ගැනීම, ගුරු අධ්‍යාපන, උසස් අධ්‍යාපන, සංස්කෘතික කටයුතු හා දේශීය වෛද්‍ය ඇමතිතුමාගේ අභිලාෂය බැවින් මේ සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයේ යෙදී සිටින සියලු දෙනාගෙන් සහාය ඉල්ලා සිටින බව කරුණාවෙන් දන්වමි.

එන්. ඩී. කේ. කේ. වේරගොඩ,
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

පිටපත්-

1. ලේකම් - කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය - දැන ගැනීම සඳහා
2. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය - දැන ගැනීම සඳහා
3. සභාපති - කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය - දැන ගැනීම සඳහා
4. සභාපති - මධ්‍යම පරිසර අධිකාරිය - දැන ගැනීම සඳහා
5. වන සංරක්ෂක - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව - දැන ගැනීම සඳහා
6. අධ්‍යක්ෂ - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - දැන ගැනීම සඳහා
7. නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (කෘෂි)- අවශ්‍ය කටයුතු සඳහා
8. ගුරු උපදේශක (කෘෂි) - අවශ්‍ය කටයුතු සඳහා